සැකසුම - R.I.T.N. රත්නායක
ර/ඇඹිලිපොල ශ්‍රී මහින්ද ම.වි

## කාර්ය පත්‍රිකාව - 3 වන සතිය

- **නිපුණතාව 1.0** - **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි**
- **නිපුණතා මට්ටම 1.3** - **ස්වභාව රූපී නොවන සංරචන ක්‍රම භාවිතයෙන් ස්වභාවික සහ නිර්මිත පරිසරය චිත්‍රණය කරයි.**
- **ක්‍රියාකාරකම** - **1.3.1 "විවාහ මංගල උත්සව අවස්ථාවක් " ස්වභාවරූපී නොවන සංරචන ක්‍රමයට චිත්‍රණය කරමු.**

## I කොටස

**අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) ස්වභාවික චිත්‍ර කලාවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ
(i) නිදහස් ව්‍යුක්ත හැඩතල යෙදීම
(ii) ප්‍රමාණාත්මක බව නොසලකා හැරීම
(iii) සජීවී බවක් නොපෙන්වීම
(iv) පර්යාවලෝකය නොසලකාහැරීම
(v) යම්කිසි දෙයක් දෘශ්‍යමාන වන ස්වභාවය ඇසට හසුවන ආකාරයෙන් දැක්වීම

(02) ස්වභාවරූපී නොවන සංරචන ක්‍රම භාවිතයෙන් සිතුවම් ඇඳි ශිල්පියෙකු වන්නේ
(i) ඒ. සී. ජී. එස්. අමරසේකර
(ii) ජේ. ඩී. ඒ. පෙරේරා
(iii) ඩේවිඩ් පේන්ටර්
(iv) දෙවරගම්පල සිල්වත්තැන
(v) ජී. එස්. ප්‍රනාන්දු

(03) මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායට අයත් ලක්ෂණයක් නොවන්නේ
(i) ත්‍රිමාණ ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය
(ii) පර්යාවලෝක ගති ලක්ෂණ පෙන්වීම
(iii) තීරු චිත්‍ර සංරචන වල අඛණ්ඩකථන ක්‍රමය
(iv) පාර්ශවදර්ශී රූප
(v) බාහිර රේඛාවක් පෙන්වීම

(04) තීබස්වල නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවී ඇති නව රාජධානි යුගයට අයත් කුරුළු දඩයම සිතුවම මිසර සිතුවම් අතර සුවිශේෂී සිතුවමකි. මෙම සිතුවම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ

(i) වංශාධිපතියෙකු සිය බිරිඳ හා දියණිය සමඟ ඔරුවක නැගී කුරුළු දඩයමේ යන අයුරු දැක්වේ.

(ii) මෙහි පාරාවෝවරයාගේ රූපය සෙසු රූපවලට වඩා විශාලව ඇඳ තිබේ.

(iii) සිතුවමෙහි අඳුරු කහ, ගුරු, රතු, සුදු, කළු වර්ණ භාවිතයෙන් පැතලි ලෙස වර්ණ ගන්වා තිබීම

(iv) පාර්ශවීය හා ඍජුදර්ශී රීතිය අනුගමනය කරමින් මානව රූප ජ්‍යාමිතික ලක්ෂණයන්ගෙන් යුතුව ශෛලීගතව නිරූපණය කර තිබීම.

(v) සත්ත්ව රූප ස්වභාවික ලක්ෂණ නිරූපණය නොවන ලෙස ඇඳ තිබීම

(05) හින්දු ආගමික හා සාහිත්‍යය තේමා ආශ්‍රිතව ජෝර්ජ් කීට් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද නායිකා සිතුවම් තුළින් වඩාත් ප්‍රකට කෙරෙන ලක්ෂණය වනුයේ

(i) ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලා ලක්ෂණ

(ii) උපස්ථිතිවාදී කලා ලක්ෂණ

(iii) ඝනිකවාදී ශෛලිය ලක්ෂණ

(iv) සාම්ප්‍රදායික සිතුවම් හි කලා ලක්ෂණ

(v) පශ්චාත් උපස්ථිතිවාදීන්ගේ කලා ලක්ෂණ

**අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්න ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(06) ජෝර්ජ් කීට් ශිල්පියා විසින් ................................................ විහාරයේ ඇඳ ඇති සිතුවම් අතර ඝනිකවාදී ශෛලිය ලක්ෂණ ආභාස කරගත් සුවිශේෂී සිතුවමක් ................................ ........................................ ලෙස සිතුවම හඳුන්වා දිය හැකිය.

(07) ඊජිප්තු සිතුවම් අතර දක්නට ලැබෙන අක්ෂර ................................................ හෙවත් රූපාක්ෂර ලෙස හැඳින්වේ.

(08) මහනුවර යුගයේ ශිල්පියාගේ මූලික කාර්යය වනුයේ ........................................................ ........................................, බුදු සිරිතේ සිද්ධි, ඓතිහාසික පුවත් ඉතා සරලව සිතුවම් කිරීමයි.

(09) මහනුවර යුගයේ සිතුවම් අතර දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි, අඛණ්ඩකථන ක්‍රමය. මින් අදහස් කෙරෙන්නේ ........................................................................

(10) ........................................................ විහාරය මහනුවර සම්ප්‍රදායේ පහතරට සිතුවම් දක්නට ලැබෙන ස්ථානයකි.

**<u>ක්‍රියාකාරකම්</u>**

(01) ස්වභාවික හා ස්වභාවික නොවන මානව ඉරියව් අධ්‍යයනය කරමින් දළ සටහන් අඳින්න.

(02) විවාහ මංගල උත්සව අවස්ථාවක් ස්වභාවරූපී නොවන අයුරින් සම්පිණ්ඩනය කරමින් දළ සටහන් අඳින්න.

(03) රේඛාවෙන් ඇඳි දළ සටහන ඔබ කැමති මාධ්‍යයක් උපයෝගී කරගනිමින් ස්වභාවරූපී නොවන සංරචන ක්‍රමයකට වර්ණ ගන්වන්න.